**කුඩාපරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන - 2022**

---------------------------------------------------------------------

කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන(SAPP) 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතින්ත්‍රික සමාජවාදී ජනරජය හා කෘෂිකර්ම සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල(IFAD) අතර 2019 මැයි 16 දින එළඹි අංක 2000002639 දරන ණය ගිවිසුම, 2017 නොවැම්බර් 21 දින එළඹි අංක 2000001984 දරන ණය ගිවිසුම හා 2017 ජූනි 26 දින එළඹි අංක 2000001843 දරන ණය ගිවිසුමේ 9.03 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළයුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය

ණය ගිවිසුම අනුව, කෘෂිකර්ම අමාත්‍යාංශය, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතයා වන අතර කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන (SAPP) සඳහා පිහිටුවා ඇති ව්‍යාපෘති කළමනාකරණ ඒකකය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ.

වාණිජමය වශයෙන් අරමුණු කරගත් නිෂ්පාදන සහ අලෙවිකරණ පද්ධතියට සම්බන්ධ කුඩා පරිමාණ කුටුම්භයන් 57,000කගේ ආදායම සහ ආහාරයන්හි ගුණාත්මක බව තිරසාර ලෙස ඉහළ නැංවීම ව්‍යාපෘතියේ අරමුණු වේ. වාණිජ හවුල්කාරිත්වයට ප්‍රවේශය, ග්‍රාමීය මූල්‍යයට ප්‍රවේශය සහ වැඩසටහන් කළමනාකරණය සහ ප්‍රතිපත්ති යන සංරචක 03 ක් යටතේ ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක වේ.

ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 17,170 කට සමාන වූ ඇමරිකානු ඩොලර් මිලියන 105.03 ක් වන අතර ඉන් රු.මිලියන 8,892 කට සමාන වූ ඇමරිකානු ඩොලර් මිලියන 54.4 ක් සැපයීම සඳහා කෘෂිකර්ම සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල සමඟ එකඟ වී තිබුණි. ඉතිරි මුදල රු.මිලියන 8,278 ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යනය කිරිමට බලාපෙරොත්තු වේ.

ව්‍යාපෘතියේ කටයුතු 2017 ජූනි 26 දින ආරම්භ කරන ලද අතර, 2023 ජූනි 30දින වනවිට නිම කිරිමට සැලසුම් කර තිබුණි.

කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමේ දිනය 2025 ජූනි 30 දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 මතය

2022 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි වියදම් ප්‍රකාශය හා එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගනන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

**1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුනු පිළිබඳවපාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | ගිණුම්කරණ අඩුපාඩුව | කළමණාකාරිත්වයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රුපියල් 527,094 ක වියදම් මූල්‍ය ප්‍රකාශන තුළ උපචිත පදනම මත සටහන් කර නොතිබුණි. | 2023 ජනවාරි මස අග භාගයේදී ආරම්භ කර 2022 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කරන විට 2022 වර්ෂයට අදාළ වන 2023 ජනවාරි මාසයේ සිදු කරන ලද ගෙවීම් අප සලකා බැලුවෙමු. ඉහත සඳහන් කළ පළමු ගෙවීම අතපසු වීමක් වන නමුත් අනෙකුත් සියලුම උපදේශන ගෙවීම් නිසි ලෙස සලකා බලා ඇත. කෙසේ වෙතත්, ඉහත ගෙවීම් පෙබරවාරි මාසයේ දී ගෙවා ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් අනුගමනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ව්‍යාපෘතියේ ගිණුම්කරණ ප්‍රතිපත්තියට අනුව, ජංගම නොවන වත්කම් සත්‍ය වටිනාකමින් මූල්‍ය ප්‍රකාශනවල ගිණුම් තබනු ලැබේ. කෙසේ වෙතත්, වාහනයක සත්‍ය වටිනාකම රුපියල් මිලියන 17 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන තුළ එය රුපියල් මිලියන 42 ක් ලෙස එහි ඓතිහාසික වටිනාකමට ගිණුම් තබා තිබුණි. එම නිසා ජංගම නොවන වත්කම්වල මුළු වටිනාකම රුපියල් මිලියන 25කින් අධිතක්සේරු වී තිබුණි. | ඉහත ජීප් රථයේ ගැනුම් මිල රුපියල් 41,973,311 ක් වන අතර තක්සේරු දෙපාර්තමේන්තුව විසින් 2021.11.28 වන දින එය රුපියල් 17,000,000 ක් ලෙස අගය කර ඇත. 2021 විගණන වාර්තාවට අනුව, රුපියල් 24,973,311 ක අඩු වූ වටිනාකම ලියා හැරීම සඳහා SAPP විසින් කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ඉල්ලා ඇත.<br>ප්‍රධාන ගණන්දීමේ නිළධාරියාගේ අනුමැතිය සහ උපදෙස් මත මු.රෙ 108 අනුව පියවර ගනු ලැබේ. මෙම අදාළ වත්කම NADep ව්‍යාපෘතිය සඳහා මිලදී ගෙන SAPP වෙත මාරු කරන ලදී. IFAD හි නිර්දේශය මත, ඓතිහාසික වටිනාකම SAPP හි ගිණුම් වෙතට "රජයේ දායකත්වය"ලෙස ගෙන ගොස් ඇත. කෙසේ වෙතත්, වත්කමේ වටිනාකම අඩු කිරීමේ ගැළපීම "රජයේ දායකත්වය" අඩු වීමට හේතු වනු ඇත. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන තබා ගත යුතුය. |

## 3. භෞතික කාර්ය සාධනය

### 3.1 කොන්ත්‍රාත් පරිපාලනය

| | විගණන නිරීක්ෂණය | කළමණාකාරිත්වයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 දෙසැම්බර් 08 දින සමාගමක් විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවකට අනුව**,** වර්තමාන හා පුරෝකථනය කරන ලද සුළු දේශගුණික තත්ත්වයන් පිළිබඳ හා ප්‍රශස්ත ලාභදායී බෝග තේරීම වැනි විවිධ තොරතුරු ගොවීන් වෙත ලබා දීම කළමනාකරණ තොරතුරු පද්ධතිය (**MIS**) මගින් ඉස්මතු කර තිබුණි. කෙසේ වෙතත් එම පහසුකම් අවසන් ගිවිසුමට ඇතුළත් කර නොතිබුණි. අවසාන ගිවිසුම සහ පද්ධතියේ අවසාන නිමැවුම අනුව**,** මෙම MIS තොරතුරු රැස් කිරීම සහ වාර්තා සැකසීම යන අරමුණු සඳහා පමණක් භාවිතා කළ හැකි අතර එමඟින් යෝජිත පරිදි ගොවීන්ගේ ජංගම දුරකථන වලට කිසිදු තොරතුරක් ලබා නොදෙන බව නිරීක්ෂණය විය. | වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ අත්පොතෙහි සඳහන් SAPP හි ක්‍රියාකාරී විෂය පථය මත පදනම්ව TOR සකස් කරනු ලැබේ. ප්‍රතිලාභී කළමනාකරණය, ප්‍රදාන බෙදා හැරීම, ණය බෙදා හැරීම සහ පුහුණු කළමනාකරණය වැනි SAPP හි මූලික මොඩියුල ආවරණය කරන ලෙස ට IFAD ඉල්ලා සිටින ලදී. නමුත් සේවා සැපයුම්කරු විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවේ දී, ඔවුන් (වර්තමාන හා පුරෝකථනය කරන ලද සුළු දේශගුණික තත්වයන්, ප්‍රශස්ත ලාභදායී බෝග තෝරා ගැනීම ආදිය ඇතුළු) තවත් බොහෝ මොඩියුල ඇතුළත් කර ඇති නමුත් SAPP විසින් ඒවා සියල්ලම මෙම අදියරේදී අවශ්‍ය ලෙස හඳුනා නොගත් අතර TOR හි මූලික මොඩියුල පමණක් ඇතුළත් විය. | ව්‍යාපෘති අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා කළමනාකරණ තොරතුරු පද්ධතිය ක්‍රියාත්මක කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | කළමනාකරණ තොරතුරු පද්ධතිය මාස දෙකක් ඇතුළත අවසන් කිරීමට යෝජනා කර තිබුණද, කොන්ත්‍රාත් ගිවිසුම වසරකුත් මාස දෙකක කාලයක් සඳහා පස් වතාවක් දීර්ඝ කර ඇති බව නිරීක්ෂණය විය. | ක්ෂේත්‍රයෙන් සෘජුවම වලංගු දත්ත රැස් කිරීම හා පසුව වැඩසටහන්ගත මැදිහත්වීම්වල විවිධ අදියරයන් පිළිබඳ තීරණ ගැනීම සඳහා එම දත්ත සැකසීම සහ සංවිධානය කිරීම සඳහා පුළුල් MIS ස්ථාපිත කිරීමට SAPP අපේක්ෂා කරයි. 2022 ජනවාරි මාසයේදී කැනොපස් පුද්ගලික සමාගම සහ SAPP අතර MIS නිර්මාණය කිරීම, | ව්‍යාපෘති සැලසුම් නිවැරදිව හා කාර්යක්ෂමව ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා කොන්ත්‍රාත් ගිවිසුමක් අත්සන් කරන ලදී. නමුත් සත්කාරක සේවාදායක සැපයුම්කරු ලබා දීම, රට තුළ ආනයන සීමාවන් පැවතීම, MIS නිර්මාණ ඉල්ලීම් කිරීම සහ සංවර්ධනය වෙනස් කිරීම සඳහා කඩිනම් ක්‍රමය අනුගමනය කිරීම නිසා ක්‍රියාවලිය ප්‍රමාද විය. ආරම්භයේදී, SAPP හි මූලික ක්‍රියාකාරී මොඩියුල සමඟ සංවර්ධනය ආරම්භ කරන ලදී. | |
| (ඇ) | MIS සඳහා සේවාදායක පහසුකම ගිවිසුම් දින සිට මාස හතරකට පසු මිලදී ගන්නා ලදී. මේ නිසා, පළමු මාස දෙකේ ගිවිසුම තවත් දින 60 ක් දක්වා දීර්ඝ කර ඇති බව නිරීක්ෂණය විය.<br>• සේවාදායකය මිලදී ගත් දිනය - 2022/04/07<br>• ගිවිසුම අත්සන් කළ දිනය - 2022/01/03 | අවශ්‍යතා එක්රැස් කිරීමේ සහ අවසන් කිරීමේ ආරම්භක අදියර සඳහා සැලසුම් කළ කාලයට වඩා දින ගණනාවක් ගත විය. SAPP හි තොරතුරු ප්‍රවාහය අවබෝධ කර ගැනීම සඳහා සේවා සැපයුම්කරුට රැස්වීම් කිහිපයකට සහභාගී වීමට සිදු විය. සේවා සැපයුම්කරු විසින් ආරම්භක වාර්තාව ඉදිරිපත් කරන ලද්දේ සැලසුම් කිරීම සහ සංවර්ධනය පදනම් වූ ව්‍යාපාර විශ්ලේෂණය අවසන් වීමෙන් පසුවය. මෙම ක්‍රියාවලිය අවසන් වූ පසු, සේවා සැපයුම්කරු සත්කාරක සේවාදායක සේවාවක් ඉල්ලා සිටියේය. සේවා සැපයුම්කරු විසින් සපයන ලද පිරිවිතරයන් මත පදනම්ව SAPP විසින් සේවාදායකය ලබා ගැනීමට සිදු විය. | අදාළ කාල සීමාව තුළ සේවාදායක පහසුකම ලබා ගත යුතුය. |
| (ඈ) | කොන්ත්‍රාත්කරු 2023 මැයි 31 වන දින MIS සම්පූර්ණ කිරීමට සහ භාර දීමට එකඟ වී ඇති අතර පළමු මාස හය තුළ MIS නඩත්තු කිරීම නොමිලේ ලබා දීමට විද්‍යුත් තැපැල හරහා එකඟ වී ඇත. පද්ධති නඩත්තු නියමයන් සහ කොන්දේසි මූලික ගිවිසුමට ඇතුළත් කර නොමැති අතර, ඉදිරියේ දී සේවා සැපයුම්කරු විසින් කරන ලද ඉල්ලීමකට අනුව MIS නඩත්තු කිරීම සඳහා විශාල මිලක් ගෙවීම සඳහා ඉහළ අවදානමක් පවතින බව නිරීක්ෂණය විය. | ඕනෑම MIS පද්ධතියක් සඳහා වෙබ් සත්කාරකයක් තිබීම වැළැක්විය නොහැක. වෙබ් සත්කාරකත්වය පැවරීමේ වගකීම කැනොපස් (පුද්ගලික) සමාගමවෙත ලබා දී ඇතත්, සේවා සැපයුම්කරු තෝරාගෙන ඇත්තේ තරඟකාරී ක්‍රියාවලියක් මගිනි. | භාණ්ඩ හා සේවා ලබා ගැනීම සඳහා බාහිර පාර්ශවයන් සමඟ ගිවිසුම් ගත වීමේදී විචක්ෂණභාවය භාවිතා කළ යුතුය. |
| (ඉ) | අගය දාම බලමුලු ගන්වන්නන්ට (VCM) පරිගණක ලබා දීමේ අරමුණින්, ප්‍රසම්පාදන කමිටුව 2022 සැප්තැම්බර් 23 දින සමාගමකින් ටැබ් පරිගණක 60 ක් මිලදී ගැනීමට තීරණය කර මිලදී ගැනීම් සිදු කර ඇත. ටැබ් බෙදාහැරීමේ ලේඛනය පරීක්ෂා කිරීමේදී, මෙම පරිගණක VCM සඳහා පමණක් ලබා දී නොමැති බව නිරීක්ෂණය විය. | දැනට ක්ෂේත්‍ර රාජකාරි සඳහා VCM 50 දෙනෙකු සිටින අතර ප්‍රාදේශීය රාජකාරි පුළුල් කිරීම හේතුවෙන් අතිරේක VCM 10 දෙනෙකු සඳහා IFAD අනුමැතිය අපේක්ෂා කරන ලදී. ඒ අනුව ව්‍යාපාර සංවර්ධන අංශයේ ප්‍රධානියාගේ ඉල්ලීම මත ක්ෂේත්‍රයේ රාජකාරි කටයුතු සිදු කිරීමේ පහසුව සඳහා ටැබ් පරිගණක 60 ක් මිලදී ගෙන ඇත. එබැවින්, VCM වරුන්ට අමතරව, ඔවුන්ගේ රාජකාරි අවශ්‍යතාවය මත ක්ෂේත්‍ර රාජකාරිවල යෙදී සිටින SAPP PMU කාර්ය මණ්ඩලය සඳහා | ව්‍යාපෘතිය විෂය පථයෙන් පරිබාහිරව ක්‍රියාත්මක නොකළ යුතුය. |

ද ටැබ් පරිගණක ලබා දී ඇත. එසේම අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය මත රේඛීය අමාත්‍යාංශය වෙත ටැබ් පරිගණක 05 ක් නිකුත් කර ඇත.

**3.2 වැඩබිම් සංචාරයන්හි දී සිදුකරන ලද නිරීක්ෂණ**

| | විගණන නිරීක්ෂණය | කළමණාකාරිත්වයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මෙම ව්‍යාපෘතිය මගින් ක්‍රියාත්මක කරන ලද කිතුල් 4P (රාජ්‍ය-පෞද්ගලික-නිෂ්පාදක හවුල්කාරිත්වය) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ දී රජයේ දායකත්වය ගොවීන්ගේ බැංකු ගිණුම් හරහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලංකා ඉකෝ ප්‍රඩක්ට් ගරන්ටී ලිමිටඩ් සමාගම වෙත බැර කර ඇත. | ගොවීන්ගේ බැංකු ගිණුම් හරහා රජයේ දායකත්වය ලංකා ඉකෝ ප්‍රඩක්ට් ගරන්ටී ලිමිටඩ් සමාගම වෙත බැර කර ඇත. ප්‍රවර්ධකයා විසින් තම අරමුදල් උපයෝගී කර ගනිමින් SAPP කළමනාකාරීත්වය විසින් ලබා දී ඇති යෝජනාව සහ උපදෙස් අනුව භාණ්ඩ මිලදී ගෙන ඇත. සමාලෝචනය යටතේ ගොවීන්ට භාණ්ඩ බෙදා හැරීමෙන් පසු එහි මිල ගොවි ගිණුම් හරහා ප්‍රවර්ධකයාට ප්‍රතිපූරණය කර ඇත. මෙය තොග මිලදී ගැනීමේ වාසිය ලබා ගැනීම, විශේෂඥයන්ගේ දැනුම සහ සැපයුම්කරුවන් සහ ව්‍යාපෘති නිලධාරීන් විසින් ප්‍රදර්ශනය කිරීම පහසු කිරීම සහ පුහුණු කිරීම යනාදිය සමඟ ගුණාත්මක භාණ්ඩ මිලදී ගැනීම අරමුණු කර ගනිමින් 4Ps සඳහා භාවිතා කරන ලද ක්‍රියා පටිපාටිවලින් එකකි. | ප්‍රතිලාභ ගොවීන්ට ගලා යන ආකාරයට සැලසුම් සකස් කළ යුතු අතර වැඩසටහන ආරම්භයේදීම ගොවියා දැනුවත් කළ යුතුය. |
| (ආ) | ගොවීන් 404 දෙනෙකුට අදාළ රුපියල් මිලියන 10 ක මුදලක් කිතුල් රා උණු කිරීම සඳහා උඳුන් සවි කිරීම සඳහා සීමාසහිත ලංකා ඉකෝ ප්‍රඩක්ට් ගරන්ටී ලිමිටඩ් සමාගමට ලබා දී තිබුණද ගැල්වනයිස් දුම් බට, කම්බි දැලක් සහ ඇස්තමේන්තුවට අනුව තාක්ෂණික ශිල්පීන්ට ගෙවීම් සඳහා රුපියල් මිලියන 4 ක් (එක් ගොවියෙකුට රුපියල් 14,800 බැගින්) වැය කර ඇති අතර ඉතිරි රුපියල් මිලියන 6 ආයතනය විසින් අවභාවිත කර ඇත. | ඇස්තමේන්තුවට අනුව කිතුල් රා උණු කිරීම සඳහා උඳුන් සැකසීම වෙනුවෙන් එක් ගොවියෙකුට රුපියල් 25,000 ක් ලබා දී ඇත. එයින් රුපියල් 14,800 ක් ගැල්වනයිස් දුම් බටය, කම්බි දැලක් සහ කාර්මික ශිල්පීන්ගේ ගාස්තු ලබා ගැනීම සඳහා වන අතර ඉතිරිය වැලි, ගඩොල්, මැටි සහ අළු සඳහා වේ. නමුත් මිල වැඩිවීම නිසා මුළු මුදල ප්‍රමාණවත් වන්නේ ඉහත භාණ්ඩ තුන මිලදී ගැනීම සඳහා පමණි. එබැවින් වැලි, ගඩොල්, මැටි සහ අළු වැනි වෙනත් භාණ්ඩ සඳහා වන පිරිවැය පියවීමට ගොවීන් එකඟ විය. එබැවින්, ප්‍රවර්ධකයා අරමුදල් අනිසි ලෙස භාවිතා කර නැත. | භාණ්ඩයේ මිල ඉහළ ගොස් නොමැති බැවින් ගොවියා විසින් කරන ලද වියදම් නැවත ගොවියාට ලබා දිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ගොවීන්ට ලබා දිය යුතු වැහි කබා සහ හිසෙහි රඳවන පන්දම් මිලදී ගැනීම සඳහා ලංසු කැඳවා නොතිබූ අතර එම උපකරණ ගොවීන්ට භාර දුන් බවට ලිඛිත සාක්ෂි කිතුල් ව්‍යාපෘතිය සතුව නොතිබුණි. | ලංසු කැඳවීමේදී මෙම භාණ්ඩ දෙක අතපසුවී ඇති බැවින් සියලුම ලංසුකරුවන්ගෙන් දුරකථනයෙන් මිල ගණන් ලබා ගෙන ඇගයීමේදී මෙම අයිතම දෙක ද සලකා බලා ඇත. කෙසේ වෙතත්, මින් පසුව එවැනි නොසැලකිලිමත්කම්වලින් වළකින ලෙසට ප්‍රවර්ධකයාට උපදෙස් ලබා දී ඇත. | ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය අනුගමනය කළ යුතුය. |
| (ඈ) | කිතුල් කර්මාන්තයේ සිදුවන අනතුරු ආවරණය කිරීම සඳහා ගොවීන් 500 කට ජීවිත රක්ෂණ ලබා දීමට නියමිතව තිබුණද, ව්‍යාපෘතියේ නිෂ්පාදකයා වන ලංකා ඉකෝ ප්‍රඩක්ට් ගරන්ටී ලිමිටඩ් සමාගම සියලු ගොවීන් සඳහා රක්ෂණයන් ලබා දී නොතිබුණි. | 2022 වන විට ගොවීන් 142 ක් සඳහා රක්ෂණාවරණයන් ලබා දී ඇත. මේ වන විට ගොවීන් 440 ක් රක්ෂණයෙන් ආවරණය වී ඇත. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඉ) | ව්‍යාපෘති යෝජනාවේ අනුමත පරිපාලන වියදම්වලට අමතරව නිෂ්පාදකයා විසින් දරනු ලැබූ රුපියල් මිලියන 1.9 ක වෙනත් පරිපාලන වියදම් කිතුල් ව්‍යාපෘතියේ වියදම් ලෙස සඳහන් කර තිබුණි. | යෝජනාවේ වචනයෙන් සඳහන් කර නැතත් 4Pට අදාළව සැබවින්ම සිදු කරන ලද පරිපාලන වියදම් වාර්තාකර ඇත. | ව්‍යාපෘති කටයුතු සඳහා ගිවිසුමට අනුව පමණක් මුදල් වැය කළ යුතුය. |
| (ඊ) | ව්‍යාපෘති නිෂ්පාදකයා ලෙස කටයුතු කරන ලංකා ඉකෝ ප්‍රඩක්ට් ගරන්ටී ලිමිටඩ් සමාගම විසින් ලබා දීමට නියමිත දායකත්වයේ වටිනාකම රුපියල් මිලියන 34.6 කි. 2020 දෙසැම්බර් 31 වන දින වන විට මෙම සමාගම විසින් ලබා දී ඇති දායකත්වය රුපියල් මිලියන 9 කට ආසන්න වන අතර, ව්‍යාපෘතිය මගින් වාර්තා කරන ලද වියදම්වලට අදාළ ගෙවීම් වවුචර හෝ වෙනත් අදාළ ලියකියවිලි ආයතනය සතුව නොතිබූ බැවින් ලංකා ඉකෝ ප්‍රඩක්ට් ගරන්ටී ලිමිටඩ් විසින් පෙන්වා දී ඇති වියදම් පදනම් විරහිත අසත්‍ය අගයන් බව නිරීක්ෂණය කරන ලදී. | ප්‍රවර්ධකයන්ට පොත් තැබීම, ගිණුම්කරණය සහ සියලු උපකාරක ලියකියවිලි සමඟ ලිපිගොනු නඩත්තු කිරීම පිළිබඳ පුහුණුව ලබා දුන් අතර ඒ අනුව කටයුතු කරන ලෙස ඉල්ලා සිටින ලදී. | සියලු කටයුතු ව්‍යාපෘති කළමනාකාරිත්වය විසින් අධීක්ෂණය කළ යුතුය. |
| (උ) | මෙම ව්‍යාපෘතියට සම්බන්ධ ගොවීන් විසින් මෙම ව්‍යාපෘතියට ලබා දීමට නියමිතව තිබූ දායකත්වය එක් ගොවියෙකුට රුපියල් 165,873 ක් වන අතර මුළු මුදල රුපියල් මිලියන 83 කි. ප්‍රතිලාභීන්ගේ දායකත්වය ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල සඳහන් කර නොමැත. කිතුල් උණු කිරීම සඳහා ගෘහස්ථ කර්මාන්තශාලාවල වටිනාකම රුපියල් | ප්‍රතිලාභී දායකත්වය ගණනය කිරීම සඳහා භාවිතා කර ඇති සමීකරණය මූල්‍ය ප්‍රකාශන සටහන් වල සකස් කිරීමේ පදනම (2.1) ඇ යටතේ අනාවරණය ඇත. | ව්‍යාපෘති අගයන් නිවැරදිව ගණනය කළ යුතුය. |

176,324 ක් වුවද ඇස්තමේන්තු කර ඇත්තේ රුපියල් 150,000 කි. ඒ අනුව මෙම ව්‍යාපෘතියේ වටිනාකම රුපියල් ලක්ෂ 13කින් අවතක්සේරු වී ඇත.

**3.3 ඌන උපයෝජිත සම්පත්**

| | විගණන නිරීක්ෂණය | කළමණාකාරිත්වයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතිය 2023 ජූනි 30 දිනට අවසන් කළ යුතු වුවද, 2025 ජූනි 30 දක්වා ව්‍යාපෘතිය පවත්වාගෙන යාමට IFAD විසින් අනුමැතිය ලබා දී තිබුණි. 2022 දෙසැම්බර් 31 දිනට අරමුදල් උපයෝජනය කිරීමේ ප්‍රගතිය සලකා බැලීමේදී, IFAD ණය මගින් වෙන් කරන ලද ඇමරිකානු ඩොලර් මිලියන 54.4 ක් තුළින් ව්‍යාපෘතිය උපයෝගී කර ගෙන ඇත්තේ ඇමරිකානු ඩොලර් මිලියන 21.11 ක් පමණක් බව නිරීක්ෂණය විය. ප්‍රතිශතයක් ලෙස එය සියයට 39 ක් විය. එමනිසා, වසර දෙකක ඉතිරි කාල පරිච්ඡේදය සලකා බැලීමේදී අරමුදල් භාවිතා කිරීම අකාර්යක්ෂම බව නිරීක්ෂණය විය. | IFAD අරමුදල් උපයෝජනයේ වර්තමාන ප්‍රගතිය (2023 ජූනි 15 දක්වා) සියයට 42 කි. කෝවිඩ් -19 වසංගතය සහ විදේශ විනිමය ගැටළු වැඩසටහනේ ප්‍රගතියට දැඩි ලෙස බලපෑවේය. මෙම තත්ත්වයන් සැලකිල්ලට ගනිමින් IFAD විසින් ගිණුම් වසා දැමීම සඳහා මාස 6 ක් සමඟ 2025 දෙසැම්බර් මස 31 වන දින දක්වා වසර 2 කින් මෙම වැඩසටහනේ කාලසීමාව දීර්ඝ කර ඇත.<br>SAPP කළමනාකාරීත්වය විසින් ලබා දී ඇති කාලය තුළ ඉතිරි අරමුදල භාවිතා කිරීම සඳහා උපායමාර්ගික සැලසුම් සකස් කර ඇත. | ව්‍යාපෘතිය විසින් නියමිත කාලය තුළ එහි අරමුණු සාක්ෂාත් කර ගත යුතුය. |
| (ආ) | තවද, SAPP සඳහා ශ්‍රී ලංකා රජයේ මුළු එකඟවූ දායකත්වය ඇමරිකානු ඩොලර් මිලියන 19.30 ක් වන අතර, සමාලෝචිත වර්ෂය වන විට රජයේ අරමුදල්හි සමුච්චිත භාවිතය ඇමරිකානු ඩොලර් මිලියන 5.99 ක් පමණක් වන අතර එය එකඟ වූ මුදලින් සියයට 31 කට සමාන වේ. මෙම ව්‍යාපෘතිය 2025 ජූනි 30 දින වන විට අවසන් කිරීමට නියමිත අතර ඉදිරි වසර දෙක තුළ එකඟ වූ රජයේ අරමුදලෙන් ඉතිරි සියයට 69 භාවිතා කිරීම අවිනිශ්චිතය. | IFAD ණය අරමුදල් උපයෝගී කර ගැනීම අවසන් කිරීම සඳහා, SAPP විසින් රජයේ වක්‍රීය අරමුදල් භාවිතා කිරීම ආරම්භ කරන ලදී. මේ වන විට GOSL ප්‍රගතිය සියයට 38 කි. CBSL ඉල්ලීම මත දළ වශයෙන් තවත් රුපියල් මිලියන 500 ක් (ඇමරිකානු ඩොලර් මිලියන 1.5 ක්) මෙම මාසය තුළ දැරීමට නියමිතය. | ව්‍යාපෘතිය විසින් නියමිත කාලය තුළ එහි අරමුණු සාක්ෂාත් කර ගත යුතුය. |
| (ඇ) | IFAD ණය මුදල උපයෝගී කර ගැනීම සලකා බැලීමේදී, මූල්‍ය ගිවිසුම් මගින් උපදේශන සහ උපදේශන නොවන සේවාවන් සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 8.63 ක මුදලක් වෙන් කර තිබුණි. නමුත්, 2022 දෙසැම්බර් 31 දින වන විට භාවිතය ඇමරිකානු ඩොලර් මිලියන 1.32 ක් විය. ප්‍රතිශතයක් ලෙස එය සියයට 15 කට සමාන විය. 2023 අප්‍රේල් 17 දිනට ඇමෙරිකානු ඩොලර් මිලියන 5 ක මුදලක් උපදේශනයන්ට වෙන්කිරීමේ සිට ප්‍රදාන කාණ්ඩයට මාරු කර ඇති බව නිරීක්ෂණය | පුරෝකථනයන් පදනම් වී ඇත්තේ සියලු පාරිසරික සාධක සාමාන්‍ය පරිදි පවතිනු ඇතැයි යන උපකල්පනය මත ය. නමුත් 2020 සිට කොවිඩ් වසංගතය සහ ආර්ථික අර්බුදය හේතුවෙන් රට අසාමාන්‍ය විය. මේ අතර, වත්මන් රජයේ ජනවරමට අනුකූලව ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම සඳහා ප්‍රමුඛතාවයක් ලෙස බඩඉරිඟු ගොවීන්ට පොහොර සහ බීජ ලබා දීම සඳහා රජය විසින් නව යෝජනාවක් ඉදිරිපත් කරන ලදී. IFAD විසින් යෝජනාව සමාලෝචනය කර ඇති අතර එම යෝජනාවෙහි ඇතුළත් | ව්‍යාපෘති ඉලක්ක නියමිත කාලය තුළ සාක්ෂාත් කර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | විය. එබැවින් IFAD සමඟ ගිවිසුම් අත්සන් කිරීමේ අදියරේදී මුදල් අමාත්‍යාංශය විසින් වියදම් ඇස්තමේන්තු කිරීම ප්‍රශස්ත ලෙස පුරෝකථනය කර නොමැති බව තවදුරටත් නිරීක්ෂණය විය. | කාණ්ඩ අතර ප්‍රතිපාදන සංශෝධනය කිරීමට එකඟ වී ඇත. මේ අනුව, ප්‍රධාන වශයෙන් ගොවීන්ට පොහොර සහ බීජ බෙදා හැරීම සඳහා අලුතින් යෝජිත බඩඉරිඟු ව්‍යාපෘතිය SAPP වැඩසටහනට ඇතුළත් කර ඇත. තවද ව්‍යාපෘතියේ කාලය වසර 2 කින් දීර්ඝ කිරීමට IFAD එකඟ වී ඇත. නව ව්‍යාපෘතිය සහ වසර 2 ක් දීර්ඝ කිරීම මත පදනම්ව, සංශෝධිත අරමුදල් පුරෝකථනයන් සකස් කර IFAD අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. ඒ අනුව, 2023 AWPB ද සංශෝධනය කෙරේ. | |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළ දී ව්‍යාපෘතිය මගින් රුපියල් මිලියන 1,264 ක ආපසු ගෙවිය හැකි විදේශ ණය සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදනවලින් ප්‍රයෝජනයට ගෙන ඇත්තේ රුපියල් මිලියන 789 ක් පමණක් බව නිරීක්ෂණය විය. ඒ අනුව මුළු ප්‍රතිපාදනවලින් සියයට 38 ක් නියෝජනය වන පරිදි රුපියල් මිලියන 475 ක ප්‍රතිපාදන ව්‍යාපෘතිය මගින් ප්‍රයෝජනයට ගෙන නොමැත. | ආනයන තහනම සහ සැපයුම්කරුවන් මුහුණ දී ඇති විදේශ විනිමය හිඟය හේතුවෙන් ගොවීන්ට උපකරණ මිලදී ගැනීම සහ බෙදා හැරීමේ ක්‍රියාවලිය ප්‍රමාද වී ඇත. එබැවින් ගොවීන් වෙනුවෙන් ප්‍රදානයන් සඳහා වූ ප්‍රතිපාදන ඉතුරුම් ලෙස පැවතුණි. | ව්‍යාපෘති ඉලක්ක නියමිත කාලය තුළ සාක්ෂාත් කර ගත යුතුය. |
| (ඉ) | ප්‍රතිලාභීන් 350 දෙනෙකු ඉලක්ක කරගත් කුරුළු සංවර්ධන ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 151 ක් ඇස්තමේන්තු කර තිබුණි. 2022 දෙසැම්බර් 31 දිනට සිදු කරන ඇති සැබෑ වියදම රුපියල් මිලියන 40 කි. ඒ අනුව කුරුළු සංවර්ධන ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය සියයට 26 ක් තරම් අඩු මට්ටමක පැවතුණි. | සැබෑ වියදම් (2022.12.31) - රු.39,935,000. මූල්‍ය ප්‍රගතිය සියයට 26 ක් තරම් අඩු විය. ගොවි සමිති විසින් තෝරාගන්නා ලද ගොවීන් CBSL හි නැවත පරීක්ෂා කරන ලද අතර PFI විසින් ගොවීන් 142 දෙනෙකුට පමණක් ණය නිකුත් කර ඇත. බැංකු ගොවීන්ගෙන් ණය අයකර ගැනීමට කටයුතු කරමින් සිටී. ගොවීන් 85 දෙනෙකුට පමණක් ප්‍රතිපාදන නිකුත් කරනු ලබන නමුත් මෙම ව්‍යාපෘතිය තාවකාලිකව ආරම්භක අවධියේ පවත්වා ගැනීමට සිදුව ඇත්තේ SAPP පාලනයෙන් ඔබ්බට ගිය පදනමක් මතය. | කුරුළු ප්‍රතිලාභීන් සංවර්ධනය කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය නිසි සැලැස්මක් ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | නිසි උපකරණ භාවිතා කරමින් පුහුණු කුරුඳු නිෂ්පාදකයින් විසින් පිරිසිදු හා උසස් තත්ත්වයේ කුරුඳු නිෂ්පාදන වෙළඳපොළට ලබා දීම, කුරුඳු වගාකරුවන් නව සංස්කෘතික පිළිවෙත් පිළිබඳ පුහුණු කිරීම කුරුඳු සංවර්ධන ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ ලෙස ඉස්මතු කර තිබුණි. කෙසේ වෙතත් වසර 04 ක් ගෙවී ගියද 2022 දෙසැම්බර් 31 වන තෙක් මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීමට නොහැකි වී තිබුණි. | මෙම ව්‍යාපෘතිය තාවකාලිකව ආරම්භක අවදියේ පවත්වා ගැනීමට සිදුව ඇත්තේ SAPP පාලනයෙන් ගිය පදනමක් මතය. | හඳුනාගත් ඉලක්ක කරා ළඟා විය හැකි ආකාරයට ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ යුතුය. |
| (උ) | ප්‍රතිලාභීන් 350 ක් ඉලක්ක කර තිබුණද, සැබවින්ම හඳුනාගත් ප්‍රතිලාභීන් සංඛ්‍යාව 85 කි. කුරුඳු සැකසුම් මධ්‍යස්ථාන හතක් ඉදිකිරීමට නියමිතව තිබුණද කුරුඳු මධ්‍යස්ථාන ඉදිකර නොතිබුණි. | ගොවි සංවිධානය කුරුඳු මධ්‍යස්ථාන ඉදිකිරීම අවසන් කළ පසු SAPP විසින් මධ්‍යස්ථාන සපයනු ඇත. එහෙත් ගොවීන් විසින් ඉදිකර ඇත්තේ එක් මධ්‍යස්ථානයක් පමණි. | බලපෑමට ලක් වූ අසාර්ථකත්වය හඳුනාගෙන නිවැරදිව ක්‍රියාත්මක කළ යුතුය. |
| (ඌ) | කහ ව්‍යාපෘතිය සඳහා අපේක්ෂිත වියදම රුපියල් මිලියන 37 ක් වූ අතර සැබෑ වියදම රුපියල් මිලියන 15.6 කි. කහ නිෂ්පාදනයේ ගුණාත්මක භාවය ඉහළ නැංවීම, කහ බීජ නිෂ්පාදනයේ අවශ්‍යතාවය සපුරාලීම සඳහා කහ බීජ නිෂ්පාදන ඒකක පිහිටුවීම, කහ වගාව තුළින් වාර්ෂික මුළු ආදායම ඉහළ නැංවීම සහ ගොවි සංවිධානයේ ධාරිතාව ඉහළ නංවා ගනිමින් ගොවි සංවිධානය වෙළඳපොළ ඉලක්ක කරගත් සමාජ ව්‍යවසායක් බවට පත් කිරීමේ ඉලක්කය ද මෙම ව්‍යාපෘතියේ අරමුණු විය. මෙම කහ වගා ව්‍යාපෘතිය අසාර්ථක වී ඇති අතර රුපියල් මිලියන 15.6 ක වියදම නිෂ්කාර්ය වියදමක් බවට පත්ව ඇති බව නිරීක්ෂණය විය. | මෙම ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාත්මක වූ නමුත් රජයේ ප්‍රතිපත්තිමය තීරණයන් ව්‍යාපෘතියට බරපතල ලෙස බලපායි. | විදේශ වෙළෙඳපොළ හඳුනාගත යුතුයි. |
| (එ) | කැවෙන්ඩිෂ් කෙසෙල් වගා ව්‍යාපෘතිය සඳහා ප්‍රතිලාභීන් 28 දෙනෙකුට බැංකු මගින් රුපියල් මිලියන 15.6 ක ණය මුදලක් ලබා දී ඇති අතර කෙසෙල් වගාවන් අසාර්ථක වීම හේතුවෙන් එම ණය ගෙවීම පැහැර හැර ඇති බව විගණනය සිදු කළ දිනට නිරීක්ෂණය විය. එමෙන්ම කැවෙන්ඩිෂ් කෙසෙල් වගා ව්‍යාපෘතිය අසාර්ථක වී ඇති බවත් ඒ සඳහා වැය වූ වියදම නිෂ්කාර්ය වියදමක් බවත් නිරීක්ෂණය විය. | ප්‍රතිලාභීන් 28 දෙනෙකුට රුපියල් 15,600,000 ක ණය ප්‍රමාණයක් බැංකු මගින් ලබා දී ඇති අතර කෙසෙල් වගාව අසාර්ථක වීම හේතුවෙන් එම ණය ගෙවීම පැහැර හැර ඇත. ඒ සඳහා දරන ලද වියදම නිෂ්ඵල වියදමක් විය. දේශීය වර්ගයේ කැවෙන්ඩිෂ් කෙසෙල් වල වර්ධනය සඳහා සහ ඵල දැරීම සඳහා කෘතිම පොහොර අවශ්‍ය නොවේ නම්. රසායනික පොහොර තහනම් කිරීමට රජය ගත් ප්‍රතිපත්තිමය තීරණය නිසා ව්‍යාපෘතිය අසාර්ථක වූ අතර මෙම ගොවීන්ට අස්වැන්නක් ලබා ගැනීමට නොහැකි විය. | හඳුනාගත් අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ව්‍යාපෘතිය සැලසුම් කළ යුතුය. |

## 3.4 මතභේදාත්මක ගනුදෙනු

**විගණන නිරීක්ෂණය**

(අ) පැල්වත්ත කිරි නිෂ්පාදන සහ කොලඹගේ ඩිස්ට්‍රිබියුටර්ස් ලංකා යන ආයතන කුඩාපරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන (SAPP) සමඟ පිළිවෙළින් කිරි නිෂ්පාදන සංවර්ධනය සහ බීජ අර්තාපල් සඳහා වසර තුනක කාලයක් සඳහා ගිවිසුම් අත්සන් කර තිබුණි. එහෙත්, මෙම සමාගම් 2022 දෙසැම්බර් 31 දින වන විටත් කිසිදු දායකත්වයක නිරත නොවීය. එමෙන්ම එම ආයතනවල එකඟ වූ කාල සීමාව 2023 ජුලි මාසයේදී අවසන් වන අතර ව්‍යාපෘතියේ ප්‍රගතිය දුර්වල අවදියක පවතින බව නිරීක්ෂණය විය.

**කළමණාකාරිත්වයේ ප්‍රතිචාරය**

- **පැල්වත්ත කිරි නිෂ්පාදන සමාගම**
- SAPP සමඟ වැඩසටහන් කටයුතු ආරම්භ කර ඇතත්, සමාගම ව්‍යාපෘතිය සඳහා කළමනාකරුවෙකු බඳවා ගැනීමේ ක්‍රියාවලිය අවසන් කර නොතිබුණි. ඒ නිසා ව්‍යාපෘතිය නිසි ලෙස ක්‍රියාත්මක වුයේ නැත. SAPP විසින් ප්‍රවර්ධකයාට දැනුම් දී ඇත්තේ මෙම කාර්යය සම්පූර්ණ කිරීමට අපොහොසත් වුවහොත් SAPP ව්‍යාපෘතිය අවසන් කර දමන බවයි. පසුව මෙම ව්‍යාපෘතිය කඩිනම් කිරීමට ප්‍රවර්ධකයා එකඟ විය. වසර 2023 දී, ඔවුන් කළමනාකරුවෙකු බඳවා ගෙන ඇති අතර මේ වන විට ක්ෂේත්‍ර සංවිධානය සහ ව්‍යාප්ති කටයුතු ක්‍රියාත්මක වේ. සමාගම කළමනාකරුගේ වැටුප් පිරිවැය දරනු ලබන අතර ක්ෂේත්‍ර දින සංවිධානය කිරීමේ සහ ක්ෂේත්‍ර ව්‍යාප්ති කටයුතු වල පිරිවැය ද ආවරණය කරයි. ප්‍රවර්ධකයාගේ මෙම දායකත්වය 2023 මූල්‍ය ප්‍රකාශනවල "සමාගම් දායකත්වය" ලෙස වාර්තා කරනු ඇත.

- **බීජ අර්තාපල් ව්‍යාපෘතිය**

  IFAD වෙතින් විරෝධතා නිෂ්කාශනය (NOC) ලැබීමෙන් පසු, COVID-19 අවස්ථාවේ දී 4P බිම් මට්ටමේ කටයුතු ආරම්භ කර ඇති අතර 2021 ජූලි 22 වන දින ගිවිසුම අත්සන් කර ඇත. බීජ අර්තාපල් (කුඩා කඳ) නිෂ්පාදනය ඉතා තාක්ෂණික වන අතර තාක්ෂණික සහාය හා උපකරණ මධ්‍යම පළාත් පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ලබා දෙන ලදී.

- **කොලඹගේ ලංකා සමාගම**

  මෙම සමාගම ගොවීන්ට ද්‍රව්‍ය සැපයීම සඳහා සම්බන්ධ වන අතර (උදාහරණයක් ලෙස, විෂබීජහරණය කරන ලද මාධ්‍යන් සමඟ බෑග් සාදන්න) SAPP ගොවීන් වෙත සෘජුවට ගෙවීම් කරයි. 2023 වර්ෂය සඳහා ප්‍රවර්ධක දායකත්වය ලබා ගැනීමට නියමිතය.

**විගණකගේ නිර්දේශය**

ව්‍යාපෘති ක්‍රියාත්මක කර අපේක්ෂිත ප්‍රතිඵල ලඟා කර ගත යුතුය.

| | | | |
|---|---|---|---|
| (ආ) | කුරුඳු ව්‍යාපෘතිය - රුපියල් 2,434,594 ක් සේවා සපයන්නෙකු ලෙස තෝරාගත් පෞද්ගලික ආයතනයකට සිදු කරන ලද කාර්යයන් අධීක්ෂණය කිරීමකින් තොරව ගෙවා ඇත. තවද ආයතනය විසින් සපයනු ලබන සේවාවන් මොනවාද යන්න විගණනයේදී හඳුනා ගැනීමට නොහැකි විය. ඒ අනුව එම ව්‍යාපෘති සඳහා වැය කර ඇති රුපියල් 39,935,000 ක මුදල නිෂ්කාර්ය වියදමක් බව නිරීක්ෂණය විය. | ආයතනික ශක්තිමත් කිරීමේ කාර්යය ඉටු කිරීම සඳහා සේවා සැපයුම්කරු පත් කර ඇති අතර සේවා සැපයුම්කරු විසින් ඉදිරිපත් කරන ලද කාර්යයන් පිළිබඳ වාර්තා ඇගයීමෙන් පසු ගිවිසුමට අනුව ගෙවා ඇත්තේ රුපියල් 1,999,593.75 ක් පමණි. ගොවීන් සඳහා ණය ලෙස රුපියල් 39,935,000 ක මුදලක් (ගොවීන් 142 ක් සඳහා රුපියල් 35,300,000) සහ ගොවි සංවර්ධන කටයුතු සඳහා ප්‍රධාන (ගොවීන් 85 දෙනෙකු සඳහා රුපියල් 4,635,000) ලෙස ගොවීන්ට නිකුත් කර ඇත. ගොවීන් විසින් සිදු කරනු ලබන ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීමෙන් පසු, VCM, ප්‍රවර්ධක සහ SAPP M&E කණ්ඩායමේ සහතිකය සහිතව ඔවුන්ගෙ කේවල හිමිකම් වවුචර මත ප්‍රදාන නිකුත් කරනු ලැබේ. ගොවීන් මෙම ණය අරමුදල් ගොවි සංවර්ධන කටයුතු සඳහා යොදා ගෙන ඇති අතර මේ වන විට බැංකු විසින් ණය අයකර ගැනීමේ ක්‍රියාවලියක යෙදී සිටී. | අරමුදල් අරපිරිමැස්මෙන් භාවිතා කළ යුතු අතර සැලසුම් සහගතව ඉලක්ක කරා ළඟා විය යුතුය. |
| (ඇ) | අම්පාර දිස්ත්‍රික්කයේ සීමාසහිත අම්පාර ගෝනගල කෘෂිද්‍රව්‍ය නිෂ්පාදකයින්ගේ සහ අලෙවිකරුවන්ගේ සමුපකාර සමිතිය (ප්‍රවර්ධක) සමාගම විසින් ප්‍රතිලාභීන් 110 දෙනෙකු ඉලක්ක කර ගනිමින් කහ වගා කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී. මෙම ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත වියදම රුපියල් 37,331,020 කි. රජය සහ සමුපකාර සමිතිය (ප්‍රවර්ධකයින්) අතර ඇති කරගත් ගිවිසුමකට අනුව රුපියල් 11,990,000 ක් වටිනා භාණ්ඩ ගොවීන්ට ප්‍රදානය කළ යුතු නමුත් රුපියල් 8,844,402 ක් වටිනා භාණ්ඩ ප්‍රදානය කරන තිබුණි. ඒ හේතුවෙන් රුපියල් 3,145,598 ක් වටිනා ප්‍රදාන ගොවීන්ට අහිමි වී ඇත. | මෙය රජයට තොග වශයෙන් මිලදී ගැනීමේ ඉතිරියකි. | ප්‍රසම්පාදන සැලැස්ම ක්‍රියාත්මක කළ යුතුය. |
| (ඈ) | රජය සහ සමුපකාර සමිතිය අතර ඇති කරගත් ගිවිසුමකට අනුව ගොවි සමිති සඳහා කහ පිරිසිදු කිරීමේ යන්ත්‍ර 05 ක් සඳහා රුපියල් 2,500,000 ක්, ගබඩා අලුත්වැඩියා කටයුතු සඳහා රුපියල් 300,000 ක් සහ සූර්ය වියළන යන්ත්‍ර 01 ක් සඳහා රුපියල් 3,000,000 ක් ලෙස එකතුව රුපියල් 5,800,000 ඇස්තමේන්තු | එකල සමාජයේ අවශ්‍යතාවය වූයේ එක් යන්ත්‍රයක් පමණි.<br><br>ගබඩා (ගබඩාව) අලුත්වැඩියා කිරීමේදී එය සනීපාරක්ෂක තත්වයන් සමඟ වැඩිදියුණු කළ යුතු විය. මෙය ආහාර සැකසුම් මධ්‍යස්ථානයක් බැවින් වැසිකිළි ද එම තත්ත්වයේම පවත්වාගෙන යා යුතුය. ආරක්ෂිත භාරකාරිත්වය සඳහා සහ | ව්‍යාපෘතියේ අරමුණුවලට පටහැනිව අරමුදල් වියදම් නොකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කර ඇත. එහෙත් කහ පිරිසිදු කිරීමේ යන්ත්‍ර 01 ක් සඳහා සහ ඇස්තමේන්තුවේ සහ ගිවිසුමේ සඳහන් නොවන වැසිකිළි පද්ධතියක් සහ ගබඩාවක් ඉදිකිරීම සඳහා රුපියල් 3,095,569 ක් වැය කර ඇත. තවද ගබඩා සහ වැසිකිළි පද්ධතිය ගොවීන් විසින් භාවිතා කර නොමැති බව ද නිරීක්ෂණය විය. | සනීපාරක්ෂක තත්වයන් පවත්වා ගැනීම සඳහා වැසිකිළි අගුලු සහ යතුරු යටතේ ඇත. | |
| (ඉ) | ගල්ඔය වැව්ලි සමාගම නම් උක් ව්‍යාපෘතියේ ප්‍රවර්ධකයා විසින් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනාව 2018 අප්‍රේල් මස 27 වන දින ව්‍යාපෘතියට ගැළපෙන අයුරින් සකස් කර නැවත ඉදිරිපත් කරන ලෙස දන්වා තිබූ අතර වැව්ලි සමාගම විසින් නිවැරදිව සකස් කරන ලද ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කර නොතිබුණි. නිසියාකාරව සකස් කරන ලද ව්‍යාපෘති යෝජනාවකින් තොරව ප්‍රවර්ධකයා (ගල්ඔය වැව්ලි සමාගම) සමග ගිවිසුමකට එළැඹීමෙන් උක් වගා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. | ස්වාධීන ව්‍යාපාර යෝජනා ඇගයීම් කමිටුව (BPEC) විසින් ව්‍යාපෘති යෝජනාව ඇගයීමෙන් පසු BPEC නිර්දේශය සහිතව NSC අනුමැතිය සහ IFAD විරෝධතා නිෂ්කාශනය ලබාගෙන ඇත. එම අනුමැතිය ලැබීමෙන් පසු ගිවිසුමක් සහිතව ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබයි. | ව්‍යාපෘති සඳහා නිසි ගිවිසුම් සහ අනුමැතීන් ලබා ගත යුතුය. |
| (ඊ) | ව්‍යාපෘති යෝජනාවට අනුව ගොවීන් 4,000 ක් සඳහා අන්තර් වගාකිරීම්, ඉසින යන්ත්‍රය, බුරුසු කටර් ලබා දීම සඳහා රුපියල් 312,000,000 ක් ඇස්තමේන්තු කර ඇත. එහෙත් ඉහත සඳහන් යන්ත්‍ර 03 වෙනුවට රුපියල් 138,000,000 ක් වැය කර බහු කාර්ය යන්ත්‍ර මිලදී ගෙන ඇති අතර එය ඇස්තමේන්තුගත පිරිවැයට වඩා රුපියල් 174,000,000 ක වෙනසකින් යුත් බවට නිරීක්ෂණය විය. තවද ඉසින යන්ත්‍රය මගින් කළ හැකි කාර්යයන් ඉහත බහු කාර්ය යන්ත්‍රයට ඉටු කළ නොහැකි බව ද නිරීක්ෂණය විය. | ගොවීන් 4,000 ක් සඳහා අන්තර් වගාකිරීම්, ඉසින යන්ත්‍ර, බුරුසු කටර් සඳහා ඇස්තමේන්තුගත පිරිවැය රු. 312,000,000<br><br>ඉහත සඳහන් යන්ත්‍ර 03 වෙනුවට බහු කාර්ය යන්ත්‍රය මිලදී ගැනීමට වැය කළ මුදල රු.138,000,000; ඇස්තමේන්තුගත පිරිවැය ට වඩා රු.174,000,000ක් වෙනස් වීම.<br><br>බහු-කාර්යය යන්ත්‍රය ඉසින යන්ත්‍රයේ කාර්යයන් ඉටු කළ නොහැක.<br><br>Intracultivar - පීඩාකාරී, ගොයම් කැපීම සහ පෘථුල කිරීම<br><br>බුරුසු කපනය- උක් පඳුර පිරිසිදු කිරීම සහ අස්වැන්න නෙලීම<br><br>ඉසිනය - වල් පැලෑටි පාලනය සඳහා රසායනික ද්‍රව්‍ය ඉසීම<br><br>කෙසේ වෙතත් බහු කාර්ය යන්ත්‍රය මගින් රසායනික ද්‍රව්‍ය ඉසීම වෙනුවට යාන්ත්‍රික වල් පැලෑටි පාලනය ඇතුළු පහත සඳහන් කාර්යයන් තුනක් ඉටු කළ හැකිය. | ප්‍රසම්පාදන කටයුතු සැලසුම් කිරීමේදී අවශ්‍යතාවය අනුව යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ හඳුනාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (උ) | මෙම ව්‍යාපෘතියේ ප්‍රතිලාභීන් වන ගොවීන් ගොවි සංගමයක සාමාජිකයන් විය යුතු බව ගිවිසුමේ සඳහන් වුවද, ප්‍රතිලාභීන් ගොවි සංගමයක සාමාජිකයන් නොව අවිධිමත් කණ්ඩායමක් බව නිරීක්ෂණය විය. | සියලුම ගොවීන් 4P ගිවිසුමේ 3 වන උපලේඛනයේ සඳහන් එක් ගොවි සමිතියක සාමාජිකයෝ වෙති. | සැලසුම් කිරීමේ අදියරේදී ප්‍රතිලාභීන් හඳුනාගත යුතුය. |
| (ඌ) | බහුකාර්ය යන්ත්‍ර 4,027ක් මිලදී ගැනීම සඳහා ගල්ඔය වැවිලි සමාගමවෙත රුපියල් 138,931,500ක් නිකුත් කර තිබුණද වැවිලි සමාගම මිලදී ගෙන ඇත්තේ යන්ත්‍ර 3,528ක් පමණක් බව නිරීක්ෂණය විය. | ගොවීන් 4000 දෙනාටම බහුකාර්ය යන්ත්‍ර ලබා දී ඇති අතර ගොවි ගිණුම්වලට ගෙවීම් සිදු කර ඇත. | ප්‍රතිලාභීන්ට යන්ත්‍ර ලබාදීමේදී අදාළ තොරතුරු නිවැරදිව ලේඛනගත කළ යුතුය. |
| (එ) | ගල්ඔය වැවිලි සමාගම (ප්‍රවර්ධකයා) විසින් ව්‍යාපෘතියේ ප්‍රගතිය පිළිබඳ වාර්තා ඉදිරිපත් කළ යුතු වුවද, එවැනි වාර්තා ඉදිරිපත් කර නොතිබූ අතර උක් වගා ව්‍යාපෘතියේ ප්‍රතිලාභීන් 4,000 ක් පිළිබඳ තොරතුරු ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන ගොස් නොතිබුණි. | වරින් වර ප්‍රගති වාර්තා නියමිත වේලාවට ඉදිරිපත් කරන ලෙස සියලුම ප්‍රවර්ධකයින්ගෙන් ඉල්ලා සිටියි. | වාර්තා යාවත්කාලීනව තබා ගත යුතුය. |
| (ඒ) | 2018 ඔක්තෝම්බර් 30 දින කිරි නිෂ්පාදන සංවර්ධනය සඳහා වෙලෝ කිරි නිෂ්පාදන (පුද්) සමාගම සමඟ වසර පහක 4P ව්‍යාපෘතියක් සඳහා SAPP ගිවිසුමකට ඇතුළත් වෙන ලදී. මෙම ගිවිසුමට අනුව එකඟ වූ පෞද්ගලික අංශයේ මුළු දායකත්වය රුපියල් 11,807,578 කි. කෙසේ වෙතත්, 2022 දෙසැම්බර් 31 වන විට සමාගමේ දායකත්වය රුපියල් 67,384,143 ක් ලෙස සටහන් කර ඇති අතර එය SAAP විසින් ගිණුම්ගත කර ඇත. ඒ අනුව මෙම ව්‍යාපෘතිය සඳහා ප්‍රවර්ධක සමාගමේ එකඟ වූ වටිනාකම රුපියල් 55,576,565 කින් ඉක්මවා ගොස් ඇත. ඒ අනුව නිසි ඇගයීමකින් තොරව එම වටිනාකම SAPP විසින් වාර්තා කර තිබුණි. | වාර්තාගත වටිනාකම සඳහා නිසි සාධාරණීකරණයක් සහිතව ඇගයීම ඉදිරිපත් කරන ලෙස දැනටමත් ප්‍රවර්ධකයාගෙන් ඉල්ලා ඇත. | ව්‍යාපෘතිය ප්‍රවර්ධකයන්ට මග පෙන්විය යුතුය. |

## 3.5 පද්ධති සහ පාලනයන්

| | විගණන නිරීක්ෂණය | කළමණාකාරිත්වයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සීමාසහිත ඒකාබද්ධ කෘෂි ව්‍යාපාර සමාගමේ ගෙවතු කුකුළු ගොවිතැන, CEETEE කිරි සංවර්ධන සහ කව්පි ව්‍යාපෘති පිළිබඳ නියැදි විගණනයට අනුව, මූල්‍ය ප්‍රකාශනයේ සටහන් අංක 07 යටතේ වාර්තා කර ඇති ප්‍රදානය ලබා ගත් ප්‍රතිලාභීන් සංඛ්‍යාව සහ සත්‍ය සංඛ්‍යාව අතර පරස්පරතාවයන් හඳුනාගෙන ඇත. එබැවින් SAPP විසින් නිකුත් කරන ලද ප්‍රදාන පිළිබඳ ප්‍රගති වාර්තාව මගින් ප්‍රතිලාභීන් සංඛ්‍යාව පිළිබඳ විශ්වසනීය තොරතුරු ලබා දී නොතිබුණි. | SAPP සමඟ සම්බන්ධ ප්‍රතිලාභී ගොවීන් ක්ෂේත්‍රයේ විවිධ අදියරවල සිටියි. ප්‍රතිලාභීන් ණය අරමුදල් වලින් හෝ ඔවුන්ගේම අරමුදල් වලින් ව්‍යාපෘති කටයුතු ආරම්භ කරයි. ඉදිකිරීම් හෝ උපකරණ බෙදා හැරීම වැනි ප්‍රදාන යටතේ ක්‍රියාකාරකම් අවසන් වූ පසු, හිමිකම් වවුචර ගෙවීම සඳහා ඉදිරිපත් කරනු ලැබේ. මේ අනුව, භෞතිකව නිරත වන ගොවීන්ගේ සංඛ්‍යාව සෑම විටම ප්‍රදාන ලබා ගන්නා ගොවීන්ගේ සංඛ්‍යාවට වඩා වෙනස් වේ. | ප්‍රතිලාභීන් නිවැරදිව හඳුනාගෙන නිවැරදිව වාර්තා කළ යුතුය. |
| (ආ) | දසිනි විජලන මධ්‍යස්ථානය (මුරුංගා වගා ව්‍යාපෘතිය), උත්සහාය කුරුඳු වගාකරුවන් (කුරුඳු වගා ව්‍යාපෘතිය) සහ බණ්ඩාරවෙල කිරි නිෂ්පාදකයින්ගේ (කිරි සංවර්ධන ව්‍යාපෘතිය) ව්‍යාපෘති වලට අදාළ රුපියල් 17,485,000 ක මුදල කුඩාපරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන (SAPP) විසින් අත්හිටුවා ඇති අතර ඒ හේතුවෙන් ව්‍යාපෘතිය විසින් දරනු ලබන වියදම් අකාර්යක්ෂම වියදම් ලෙස නිරීක්ෂණය විය. | මෙම ව්‍යාපෘති තුන අත්හිටුවනු ලැබුවද, මෙම ව්‍යාපෘති තුනේ SAPP විසින් ණය සහ ප්‍රදාන පහසුකම් සැපයූ ප්‍රතිලාභීන් තවමත් වෙනත් SAPP ප්‍රවර්ධකයින් සමඟ කටයුතු කරමින් සිටී. තනි ගොවීන් ව්‍යාපාරය කරගෙන යමින් සිටියි. | අරමුදල් කාර්යක්ෂමව හා නිසි ලෙස වියදම් කළ යුතුය. |